# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2009 අංක 27 දරන මහවැලි සංස්කෘතික පදනම් භාරයේ අධ්‍යක්ෂ මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 මැයි මස 06 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 මැයි මස 07 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 7.00 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

**2009 අංක 27 දරන මහවැලි සංස්කෘතික පදනම් භාරයේ අධ්‍යක්ෂ මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 2009 මැයි මස 06 වන දින]

එල්. ඩී.— ඕ. (අයි.එන්.සී.) 7/2007.

**මහවැලි සංස්කෘතික පදනම් භාරයේ අධ්‍යක්ෂ මණ්ඩලය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

"මහවැලි කල්චරල් ෆවුන්ඩේෂන් ට්‍රස්ට්" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සමාගමක් 1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කරනු ලැබ එහි මෙතෙක් බලාත්මකව පැවති රීති සහ එම සමාගමේ සාංගමික සංස්ථා පත්‍රය සහ ව්‍යවස්ථාවලිය අනුව, එකී සමාගමට සම්බන්ධ සියලු පරමාර්ථ හා කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කර ගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සමාගම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා එකී සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙතෙක් කල් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් ද:

එකී අධ්‍යක්ෂ මණ්ඩලය සංස්ථාගත කරන ලෙස ඉල්ලුම් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීමට ඉඩ දීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2009 අංක 27 දරන මහවැලි සංස්කෘතික පදනම් භාරයේ අධ්‍යක්ෂ මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

මහවැලි සංස්කෘතික පදනම් භාරයේ අධ්‍යක්ෂ මණ්ඩලය සංස්ථාගත කිරීම

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "භාරය" යනුවෙන් සඳහන් කරනු ලබන) "මහවැලි කල්චරල් ෆවුන්ඩේෂන් ට්‍රස්ට්" හි අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනට සාමාජිකයන් වන තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු බඳවා ගනු ලබන තැනැත්තන් ද (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "මහවැලි සංස්කෘතික පදනම් භාරයේ අධ්‍යක්ෂ මණ්ඩලය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති

සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරිය ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) දැනට ඉදි වෙමින් පවතින පූජනීය කොත්මලේ මහවැලි මහා සෑය සාදා නිම කිරීම සහ එකී මහවැලි මහා සෑයේ නඩත්තු කටයුතු සහ ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක කිරීම;

(ආ) මහවැලි මහා සෑය අසල සම්ප්‍රදායික බෞද්ධාගමික හා සංස්කෘතික වතාවත් ඉටු කළ හැකි අන්දමින් එහි පරිසරය සකස් කිරීමට වගබලා ගැනීම හා ඊට පහසුකම් සැලසීම ;

(ඇ) සංස්ථාවේ පරමාර්ථ අවබෝධ කරවීමෙහි ලා ප්‍රදර්ශන, දේශන, සම්මන්ත්‍රණ පැවැත්වීම, ප්‍රකාශන පළ කිරීම;

(ඈ) මහවැලි මහා සෑය පිහිටා ඇති මධ්‍යම පළාත ප්‍රමුඛ අනෙකුත් සියලුම පළාත්වල බෞද්ධ සිද්ධස්ථානවල පැවැත්ම සඳහා කටයුතු කිරීම ;

(ඉ) බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා කළ හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම අනුගමනය කිරීම ;

(ඊ) බෞද්ධ ධර්මය ආරක්ෂා කිරීම සහ එහි දේශනා කර ඇති දැහැමි දිවි පෙවෙත බෞද්ධයන් අතර ප්‍රචාරය කිරීම ;

(උ) බෞද්ධ දරු දැරියන්ගේ අධ්‍යාපනික කටයුතු වැඩිදියුණු කිරීම සහ එම දරු දැරියන්ගේ අධ්‍යාත්මික ගුණ වගාව දියුණු කිරීම ;

(ඌ) ශ්‍රී ලංකාවේ හා විදේශයන්හි බෞද්ධ සංවිධාන සමග මිත්‍ර සම්බන්ධතා ඇති කරගෙන පවත්වා ගැනීම ; සහ

(එ) බෞද්ධ සංස්කෘතික අනන්‍යතාවය ආරක්ෂා කිරීම.

**4.** (1) සංස්ථාව විසින් යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:— සංස්ථාවේ රීති.

(අ) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම ;

(ආ) ධුර දරන්නන් තෝරා පත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, ඔවුන් ධුරය හිස් කිරීම, ඔවුන් ධුරයෙන් නෙරපීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඇ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය, මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධුර කාලය සහ මණ්ඩලයේ සාමාජිකයන්ගේ පුරප්පාඩු පිරවීම ;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඉ) අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් කැඳවීම සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ රැස්වීම් පවත්වන වේලාවන්, දින, ස්ථාන, රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍රය, රැස්වීම්වල ගණපූරණය හා රැස්වීම්වල දී සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණු ; සහ

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම ;

(2) සංස්ථාව විසින් සාදනු ලද යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ ඒ රීතිය සාදනු ලැබූ ආකාරයෙන්ම සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සියලු ම සාමාජිකයන් මේ පනතේ 4 වන වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීතිවලට යටත් විය යුතුය.

සංස්ථාවේ අරමුදල.

**5.** (1) සංස්ථාවට එහි ම (මෙහි මින්මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් සංස්ථාවට හෝ සංස්ථාවේ නමට ලැබෙන සියලු මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන බැංකු එකක හෝ වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී භාරයේ බැරට යම් බැංකුවක හෝ වෙනත් ආයතනයක ඇති සියලු මුදල්, මේ පනත ක්‍රියාත්මක වන දිනයේ සිට බලපවත්වන පරිදි සංස්ථාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ දේපළ පුනරුත්ථාපනය කිරීම, සංවර්ධනය කිරීම හෝ දියුණු කිරීම සඳහා යම් ක්ෂය අරමුදලක් හෝ නිධන් අරමුදලක් සංස්ථාව විසින් පිහිටුවනු ලැබිය හැකි ය.

(4) මේ පනත යටතේ සංස්ථාවේ බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලැබූ සියලු වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**6.** (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම, මේ පනතේ වෙනත් විධිවිධානවලට සහ මේ පනතේ 4 වන වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීතිවලට යටත් ව සභාපතිවරයා, ලේකම්වරයා, භාණ්ඩාගාරිකවරයා, උප සභාපතිවරයා, නියෝජ්‍ය ලේකම්වරයා සහ තවත් සාමාජිකයන්ගෙන් සමන්විත වූ ද 4 වන වගන්තිය යටතේ සාදනු ලැබූ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන්නා වූ ද, (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් පරිපාලනය කළ යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී භාරයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ධුර දැරූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සාමාජික නාමලේඛනය.

**7.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී භාරයේ සාමාජිකයකු වූ සෑම තැනැත්තකුගේ ම සහ ඉන් පසුව සංස්ථාවට සාමාජිකයකු වශයෙන් යථා පරිදි ඇතුළත් කර ගනු ලැබූ සෑම තැනැත්තකුගේ ම නම ඇතුළත් නාම ලේඛනයක් මණ්ඩලය විසින් පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.

8. සංස්ථාවේ කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාවට නැංවීම සඳහා, කලින් කලට කමිටු පත් කිරීමට සහ අවශ්‍ය යයි සලකනු ලබන වෙනත් යම් පියවර ගැනීමට සංස්ථාවට බලය තිබිය යුතු ය. කමිටු පත් කිරීම.

9. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී භාරයේ සියලුම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට භාරයට අයවිය යුතු හෝ ගෙවිය යුතු හෝ සියලුම ණය, දායක මුදල් සහ සම්මාදම් මුදල්, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය. භාරය විසින් ගෙවිය යුතු සහ භාරයට අයවිය යුතු ණය.

10. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත සඳහන් බලතල ද ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් කිසිවක් නංවාලීම හෝ වැඩිදියුණු කිරීම උදෙසා අවශ්‍ය හෝ හිතකර කවර හෝ ක්‍රියා, කාරණා හෝ දේ කිරීමට, ඉටු කිරීමට හා ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය :— සංස්ථාවේ බලතල.

(අ) අරමුදල් වැඩිදියුණු කිරීමට සහ මුදල් හෝ ඊට සමාන වෙනත් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීමට ;

(ආ) චංචල හෝ නිශ්චල දේපළ කවරාකාරයෙන් හෝ අත්කර ගැනීමට සහ දැරීමට ද, බද්දට හෝ කුලියට දීමට හෝ ගැනීමට ද, උකස් කිරීමට, ඔඩපනය කිරීමට හෝ විකිණීමට ද, නැතහොත් අන්‍යාකාරයෙන් බැහැර කිරීමට ;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් කිරීමට, පිටසන් කිරීමට, ගනුදෙනු කිරීමට, මිලට ගැනීමට, විකිණීමට හා නිකුත් කිරීමට ;

(ඈ) බැංකු ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට හා ඒ ගිණුම් වසා දැමීමට ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමට ;

(ඉ) සංස්ථාවේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් මණ්ඩලය විසින් සුදුසු යයි කල්පනා කරනු ලබන යම් ආකාරයකින් ආයෝජනය කිරීමට ;

(ඊ) සංස්ථාවට අයත් හෝ සංස්ථාව විසින් දරනු ලබන යම් ඉඩමක යම් ගොඩනැගිල්ලක් හෝ ව්‍යුහයක් ඉදි කිරීම හෝ ඉදි කිරීමට සැලැස්වීමට ;

(උ) යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් සමග කොන්ත්‍රාත් හෝ ගිවිසුම්වලට එළඹීමට ; සහ

(ඌ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට සේවයෙහි නියුක්ත කිරීමට, සේවයෙන් පහ කිරීමට හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීමට සහ සංස්ථාව විසින් නිශ්චය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ඔවුන්ට ගෙවීමට.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

11. යම් මිලට ගැනීමක් හෝ තෙස්තමේන්තු නීයාදනයක් හේතුවෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව සතු වන්නා වූ චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට හා දැරීමට නීතියෙන් සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, ඒ සියලු දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට ද පූර්ණ බලය ඇතිව, සංස්ථාවේ රීතිවලට යටත් ව මේ පනතේ කාර්යය සඳහා ඒ සියලු දේපළ සංස්ථාව විසින් දැරිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

12. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් "සුදුසුකම් ලත් විගණකවරයකු" විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

සංස්ථාවේ මුද්‍රාව.

13. සංස්ථාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා නැතහොත් මණ්ඩලය විසින් නිසි පරිදි බලය ලබා දෙන ලද වෙනත් යම් තැනැත්තකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයේ තම නම් අත්සන් කළ යුතු ය. එසේ කරනු ලබන අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

විසුරුවා හැරීමේදී ඉතිරිවන දේපළ.

14. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරි වී තිබුණහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලබන්නා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුව ම මණ්ඩලය විසින් එම ආයතනය හෝ ආයතන තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

15. ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

16. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.